# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1380/2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023

දිනය / திகதி / Date — 04/11/2023 පැය 1250

## මාධ්‍ය නිවේදනය

**01. 2023.11.03 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 01 | 03 | 48 | 540 | ගෑස් සිලින්ඩර් 01<br>තඹ දඟර 01<br>ගෑස් ලිප් 01 |

වැටලීම සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් සහ දේපල යටියන්තොට පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**02. හෙරොයින් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2023.11.03 වන උදෑසන කාලයේ මට්ටක්කුලිය පොලිස් වසමේ ශ්‍රී වික්‍රමපුර ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 250 ක් සහ ජාවාරමෙන් උපයාගත් ගත් බවට සැකකරන රු.70,200/=ක මුදලක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මට්ටක්කුලිය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මට්ටක්කුලිය පොලිස් ස්ථානය මගින් වැඩි දුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. හෙරොයින් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් දෙදෙනෙකු සහ හෙරොයින් ජාවාරම් කිරීමට ආධාර අනුබල දුන් සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2023.11.03 වන රාත්‍රි කාලයේ රාගම පොලිස් වසමේ මහර ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීම් තුනක් සිදු කර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 ක් සහ හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** සහ හෙරොයින් ජාවාරම්

කිරීමට ආධාර අනුබල දුන් සැකකරුවෙක් ද අත්අඩංගුවට ගෙන රාගම පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 43 සහ 46 වයස් වල පසුවන රාගම සහ කොළඹ 05 ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

රාගම පොලිස් ස්ථානය මගින් වැඩි දුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. හෙරොයින් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුර.**

2023.11.03 වන රාත්‍රි කාලයේ වාරියපොල පොලිස් වසමේ බණ්ඩාරකොස්වත්ත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑලග කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 02 මිලි ග්‍රෑම් 350 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වාරියපොල පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වන බණ්ඩාරකොස්වත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

වාරියපොල පොලිස් ස්ථානය මගින් වැඩි දුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. බලපත්‍ර නොමැතිව වැලි ප්‍රවාහනය කල සැකකරුවන් පස්දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මාන්කුලම් කඳවුර.**

2023.11.03 වන සවස් කාලයේ ජයපුරම් පොලිස් වසමේ මඩු රක්ෂිත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා මාන්කුලම් කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කර ටිපර් හා ට්‍රැක්ටර් රථවලින් වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් පස්දෙනෙකු** ටිපර් රථ තුනක් හා ට්‍රැක්ටර් රථ දෙකක්ද සමඟ අත්අඩංගුවට ගෙන පුනරීන් අඩවි වන කාර්යාලය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 33,41 සහ 43 වයස් වල පසුවන පෙරියකුලම්, පුදුමුරිප්පු, ඉරණමඩු, වෙන්නේරිකුලම් හා කිලිනොච්චිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ජයපුරම් පොලිස් ස්ථානය මගින් වැඩි දුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**